# ස්වයං අධ්‍යනයට අත්වැලක්

ශ්‍රේණිය - 8

වාරය - දෙවන වාරය

නිපුණතා මට්ටම-1 3 ගැමි නැටුම් හා සබැදි සුවිශේෂී ලක්ෂණ හදුනාගනිමින් නර්තනය නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම -සවරං නැටුම හා සබැදි සුවිශේෂී ලක්ෂණ හදුනාගනිමු





- සැකසුම- දිස්නා ද සිල්වා
  ම/ප වත්/ මහනුවර ආදර්ශ විදුහල
  පොල්ගොල්ල.

- මෙහෙයවීම- නර්තන අංශය
  වත්තේගම අධ්‍යාපන කලාපය.

**උපදෙස්** - මෙය ලිඛිත පාඩමකි මෙය වැඩිදුරටත් කිරීම අධ්‍යනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුයි.

හැඳින්වීම - ඔබ විසින් 6/7 ශ්‍රේණී වලදී ජීවන වෘත්තීන් හා විනෝදාස්වාදය අරමුණු කොට නිර්මාණය වූ ගැමි නැටුම් වන කළගෙඩි, ලී කෙළි, කුළු,තාලම් යන ගැම නැටුම් පිළිබඳව අධ්‍යනය කර ඇත.

මෙම පාඩම තුලින් අප සූදානම් වන්නේ විනෝදාස්වාදය අරමුණු කොට නිර්මාණය වූ සවරං නැටුමක් නිර්මාණය කර ගැනීමේදී එහි සුවිශේෂී ලක්ෂණ, ආගමික පසුබිම, සවරම භාවිතය ප්‍රාසාංගික ලක්ෂණ ඉස්මතු වන සේ නර්තනය නිර්මාණය කරන ආකාරය පිළිබද අවබෝධයක් ලබාදීමටයි.

- සවරං නැටුම අතීතයේ සිට විනෝදාස්වාදය අරමුණු කොට නිර්මාණය වී ඇති ගැමි නැටුමකි.

# සවරං නැටුම

- සවරං නම් වූ උපකරණය දෑතට ගනිමින් රංගනය යෙදේ
- සාමූහිකව රංගනයේ යෙදේ
- පෙරහැර නර්තන වල සහ ප්‍රසංග වේදිකාවේ දැකිය හැක
- සවරම අලංකාර රැළි යොදා වර්ණ ගන්වා ඇත
- සවරං රැළි විහිදී යන ආකාරයට විවිධ රටා මතු කරමින් නර්තනයෙහි යෙදේ
- සවරං රැළි යොදා සකස් කරගත් සවරම මැදින් අල්ලා නර්තනය කිරීම සිදු කරයි



**සවරම සකස් කරගන්නා ආකාරය**

අඟල් 18ක් පමණ දිග ලී දණ්ඩක දෙපසින් එල්ලා වැටෙන සේ රැලි යොදා සවරම සාදා ගැනේ

# සවරං නැටුම් නිර්මාණය

සවරං නැටුම් සදහා ගායනා කරන කවිවල ගැමි සමාජයේ ගැමියන් අතර පවතින,

- ගැමි අදැහිලි හා විශ්වාස
- නැටුමට සැරසෙන කාන්තාවන්ගේ ලාලිත්‍ය
- නර්තනයට පෙර දෙවියන්ගේ අවසර ගැනීම

ආදී කරුණු ඇතුළත් වේ.

**පැවිය ගල් නැවෙන්ජයරැස් වඩින්නට**

**වීරිය කරසිතින් ගනදුරැ හරින්නට**

**කාරිය තමයි සවරං ගෙන රගන්නට**

**සූරිය දෙවි රජුනි අවසර දෙවන් මට**

**(මාත්‍රා 3 තනිතිත)**

**දෑතට ගන්නේ සවරම පවන් සලන්නේ**

**සරඹ පාන්නේ පා පොඩි දෙක හසුරන්නේ**

**ගීත කියන්නේ සුමිහිරි තාල වයන්නේ**

**සබයට එන්නේ සවරං නැටුම් නටන්නේ**

- විවිධ නාදමාලා අනුව සවරං කවි ගායනා කළ හැකිය

මල් ගවසාලා කොණ්ඩය බැඳලා

ඉන තදකර සළු පැළඳ ගෙනේ

පියයුරු නම්ලා එන ලැම උදුලා

සලු පටකින් වයමින් යසිනේ



(මාත්‍රා 4 තනිතිත)

සිරියල් දීලා කට රතු කරලා

නා දල් මෙන් තොල් දිලිසෙමිනේ

දෙවියන් වැදලා මෙරගට බැසලා

පටන් ගනිමු සවරං රුගෙනේ

- කාන්තාවන් නැටුමට සැරසෙන ආකාරය ස්ත්‍රී ලාලිත්‍ය ඉහත කවියෙන් මනාව පිළිබිඹු වේ.

සවරං නැටුමක් නිර්මාණය කිරීමේදී,

- එහි විශේෂත්වය වන්නේ අලංකාර කරන ලද ලීය ඇඟිළි අතරෙහි රදවා ගෙන ලීය දෙපස ඇති රැළි විසිරී යන ආකාරයට අවකාශයෙහි විවිධ රටා මැවීමයි.
- සවරං නැටීමේදී එකිනෙක අතර ගැටීමක් සිදුනොකරයි.
- යුගල වශයෙන් නර්තනය කිරීමේදී ඉහළ දමා ඇල්ලීමද සිදුකරනු ලබයි .

සවරං නැටුම යොදාගන්නා අවස්ථා,

පෙරහැර



# ප්‍රසංග වේදිකාව






සවරං නැටුමෙහි විචිත්‍රත්වය මැවෙන්නේ,

විවිධ දිශාවන්ට චලනය කිරීමෙන් හා විවිධ රටාවන් මැවීමෙනි.

සවරං  නැටුමක් නිර්මාණය සඳහා,

- අවකාශ භාවිතය
- රංග රටා
- සාමූහිකත්වය
- ගායන වාදන
- අභ්‍යාස කිරීම්

යන සියලුම කරුණු ඇතුළත්ව අලංකාර සවරං නැටුමක් නිර්මාණය වේ.

